# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 10
NUMBER 09

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

DECEMBER 10, 2007 දෙසැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2551 උඳුවප් මාසය)


# තෙලේ බලේ

## ශ්‍රීලංකාවේ අනාගතය පිළිබඳ ඉඟියක්!

**සංජය විමලරත්න විසිනි**

**ශ්‍රී ලංකාව නැවතත් සිය මුහුදුකරයේ ඛණිජ තෙල් සම්පත් ගවේෂණයක යෙදීමට බලාපොරොත්තුවන බවද ඒ සඳහා තෙල් ගවේෂණය ගැන අත්දැකීම් ඇති ඉන්දියාව, ඉරානය වැනි රටවල් සම්බන්ධ කරගැන්මට අදහස් කරන බව ද දැන් සැළවේ.**

දැනට දශකයකට පෙර අප රට වටා මුහුදු තීරයේ තෙල් සෙවීම සඳහා නෝර්වේ රට සම්බන්ධකරගැන්මට එවකට ජනපතිව සිටි චන්ද්‍රිකා මැතිනිය තනි තීරණයක් ගන්නා ලද අතර ඒ කාර්‍යයේදී තෙල් සම්පත් අපට තිබෙන බවට සාක්ෂි ලැබුණු බව පළවිණ. නෝර්වේකාරයින් අප රටට ඇහිළිගැසීම ඇරඹුණේ ඒ සමගය. ඒ තෙල් සම්පත් උතුරේ මන්නාරම අවට තිබෙන බවට සාක්ෂි පෙනීම සමගම උතුර වෙන්කර ගැන්මට දඟලන කොටින් සමග ද නෝර්වේ කාරයෝ කුළුපගවීමට පටන්ගත්හ. සරණාගත මුවාවෙන් අසූවේ දශකයේ සිටම බටහිරට පැනගත් ද්‍රවිඩයෝ සෑහෙන ගණනක් නෝර්වේ රටේ ද සිටිති. ඒ මුවාවෙන් ද නෝර්වේ කොටින් හා වඩා කුළුපග වීය. ඒ සමගම 2000 මුල් කාලයේ සිට ඇරඹුණු ඊනියා සාම සාකච්ඡා උපයෝගී කරගනිමින් එවකට අගමැතිව සිටි රනිල් වික්‍රමසිංහ ද අල්ලාගෙන නෝර්වේ කාරයෝ එම සාම ක්‍රියාවලියේ සාම දූතයින්වීමට ද සමත්වූහ. ඔවුන් ඒවායේ යෙදුනේ අප රටට ඇති ආදරයක් නිසා නොවේ. ලංකාවේ තිබිය හැකියයි විශ්වාස කරන තෙල් පිළිබඳව ඉවවැටීම නිසා ය.

ඒ දිනවලම වාගේ ඉදිරි වසර 12 ක් ම තෙල් ගවේෂණ කටයුතු වල යෙදීම සඳහා නෝර්වේ වලට බලය දීමේ ගිවිසුමකට ද එම ආණ්ඩුව අත්සන් කළා ය. එම මෝඩ පියවර දැනට පවතින රජය බලයට ඒමෙන් පසු ජනතා විමුක්ති පෙරමුණේ තදබල උද්ඝෝෂණයන්ගෙන් පසුව මෑතක දී අවලංගු කරවීම සතුටට කරුණකි. සාම සාකච්ඡාවලට අත දැමූ නෝර්වේ ක්‍රියා කළේ මධ්‍යස්ථ සාම දූතයින් ලෙස නොව කොටින් සමග දැඩි ලෙන්ගතුකමක් දක්වමිනි. බැරිවෙලාවත් කොටි ඊළම පිහිටුවා ගතහොත් එතැනදී තෙල්වල වැඩි වාසිය කෙලින්ම නෝර්වේ රටට ය.

### තෙල් බලයේ ලෝක තත්වයන්

වැඩිම ඛණිජ තෙල් සම්පත් පිහිටා ඇත්තේ මැද පෙරදිග සහ උතුරු ඇමරිකාවේ ය. විසිවන ශත වර්ෂයේ පැවති තෙල් කැණීමේ තාක්ෂණ මට්ටම් අනුව පහසුවෙන් තෙල් නිස්සාරණය (extraction) කරගනු හැකිවූයේ ඒ ප්‍රදේශවලය. ඇමරිකාව සිය සම්පත්වලට අත නොතබා මැද පෙරදිගින් තෙල් ලබාගැන්මට යුහුසුළු වූයේ ය. එවිට ප්‍රබලම අධිරාජ්‍යවාදී රටවන බ්‍රිතාන්‍යයද ඊට හවුල්වීය. මුළු විසිවන ශත වර්ෂයේ මෙන්ම, අද දක්වාම මැද පෙරදිග දේශපාලනය මේ තෙල් සම්පත් වටා කැරකෙනුයේ මේ තෙලේ බලේ නිසාය.

තෙල් කැණීමේ හා තෙල් නිස්සාරණයේ තාක්ෂණයන් දියුණුවීම සමග ලෝකයේ වෙනත් තැන්වල ද තෙල් කර්මාන්ත ඇරඹිණ. අප්‍රිකාවේ නයිජීරියාව, මධ්‍යම ආසියාව, දකුණු ඇමරිකාවේ වෙනිසියුලාව, චීනයේ සහ ඉන්දියාවේ සමහර ප්‍රදේශ, මැලේසියාව, බුරුමය සහ බ්‍රිතාන්‍යයේ උතුරු මුහුද ද මෙසේ නව ඉන්ධන නිශ්පාදනය කරන රටවල් වෙති. මේ හැම තැනකටමත් බටහිර අධිරාජ්‍යවාදීන්ගේ බැල්ම මෙන්ම අතපෙවීම් විවිධා කාරයෙන් සිදුවිය. ඛණිජ තෙල් තිබේ නම් ඕනෑම රටක අනෙක් නිශ්පාදිත ආදායම් අභිබවා ප්‍රථම තැනට එන්නේ එයයි. බොහෝ විට එය 90% ක් පමණවෙයි. ඉතින් ඒ තැන් වලට රිංගාගැනීමට අධිරාජ්‍යවාදීන් යුහුසුළු වීම පුදුමයක් නොවෙයි. යම් රටක තෙල් තිබේ නම් එම ධන සම්පත එහි නියම උරුමක්කාරයින් වන ජනතාවගේ යහපතට යෙදෙනවා ද, එසේත් නැතිනම් එම රටේ දේශීය පාලක පන්තිය වන (සමහර තැන්වල අධිරාජ්‍ය වාදීන් සමග එක්ව) එහි ධනේශ්වර සුළු පිරිසක් සැප විඳිනවාද යන්න බල තුලනය අනුව රඳා පවතී. පසුගිය කාලයේ රටවල් කීපයක සිදුවීම් වලින් මේවා අවබෝධ කරගත හැක.

### නයිජීරියාවේ බියෆ්‍රා ( BIAFRA )අරගලය


නයිජීරියාව 1960 දී බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබන විට ද එහි අග්නිදිග ප්‍රදේශයේ ඛණිජ තෙල් ලැබී බ්‍රිතාන්‍ය පෙට්‍රෝලියම් සමාගම් එම ජාවාරමේ යෙදී සිටියහ. නිදහස ලබාගැනීමෙන් පසුව ද ඒවා එලෙසම කටයුතු කළ ද එම තෙල් සම්පත ජාතිය සතු කිරීමේ අදහස මතුවී තිබිණ. මේ තෙල් ළිං පිහිටා තිබුණේ නයිජීරියාවේ අග්නිදිග ප්‍රදේශයේ ප්‍රාන්ත තුනක් ආශ්‍රිතවය. එහි ප්‍රධාන ජන කොට්ඨාශය ඉබෝ ( IBO ) ගෝත්‍රයයි. දකුණු මුහුදුකරයේ වූ ඒ ජනයා මුල් අවධියේ සිටම බටහිර පාලනයට යටත්ව සිටි බැවින් එම ආශ්‍රය නිසාම ඔවුහු බටහිර පන්නයට හැදුණු ක්‍රිස්තු භක්තිකයෝ වූහ.

1967 දී මෙම ප්‍රාන්ත තුනේ යුද සෙනෙවියෝ එකතුවී ගෝත්‍රවාදී ලෙස බලයෙන්ම නයිජීරියාවෙන් වෙන්ව බියෆ්‍රා නමින් වෙනම රාජ්‍යයක් පිහිටුවා ගත්හ. නයිජීරියාව දැනට ද ප්‍රාන්ත 19 ක් ඇති විශාල රටකි. වැඩිමනත් ජනගහනය වූයේ අනෙක් ගෝත්‍ර දෙක වන හවුසා ෆුලානි (Housa-Fulani)සහ යොරුබා (Yoruba) යන කණ්ඩායම් ය. රටේ එවකට අගමැතිව සිටි ටෆේවා බලේවා ගේ ( Tafewa Balewa) රජය මෙම බලහත්කාරකම මැඩපැවැත්වීම සඳහා හමුදාව යෙදවී ය. ඊනියා '**බියෆ්‍රා නිදහස් අරගලය**' මින් ඇරඹිණ. මේ ගැන බටහිර මාධ්‍යය එදා තදින් ප්‍රචාරය ගෙනගිය අතර බ්‍රිතාන්‍යයේ සමහර පුවත් පත් වල සහාය ද එයට ලැබිණ. නමුත් මෙහි සත්‍ය ස්වරූපය එනම්, ඒ '**අරගලය**' තෙල් සම්පත සඳහා බටහිර බලවතුන්ගේ යටිකූට්ටු වැඩක ප්‍රතිඵලයක් බව ලෝකයා මැනවින් හඳුනාගත්හ.

එම නිදහස් සටන යුද සෙන්පතියන් විසින්ම අරඹන ලද බැවින් ද, නයිජීරියානු රජය එවැනි යුද්ධයකට සූදානම්ව නොසිටිය බැවින් ද වසර තුනක් පමණ එම අරගලය පැවතිණ. එවකට අද මෙන් නොව ඇමරිකාව හා සම සමව සෝවියට් දේශය ද බලයේ සිටි බැවින් අධිරාජ්‍යවාදීන්ට තමන්ට රිසි-සේ කටයුතු කළ නොහැකි වීය. කෙසේ වුව ද 1970 වන විට නයිජීරියානු හමුදා එම අරගලය සම්පූර්ණයෙන්ම මැඩපැවැත්වූහ. බ්‍රිතාන්‍යය ද පසු අවස්ථාවක නයිජීරියාවට සහාය දෙමින් එම රජයට අවි ආයුධ ද විකුණුවේ ය. ඒ ගැන චෝදනා කරනු ලැබූ විට බ්‍රිතාන්‍යය කීවේ රටක් කඩනවාට තමා සම්පූර්ණයෙන්ම විරුද්ධ බැවින් එසේ ආයුධ සපයා සහාය දෙන බව ය.

මෙම අරගලයේදී ඉබෝ ජනයා මිලියනයකට වඩා මියගිය බව පළවිය. නමුත් අද ද නයිජීරියාව අඛණ්ඩව එක රාජ්‍යයක් ලෙස පවතී. වැඩිකල් නොගොස් තෙල් සම්පත ජාතිය සතු කරන ලද අතර රටේ ආදායමෙන් 97 % ක් ලැබෙන්නේ තෙල් සම්පතිනි. මුලදී එම ධනය රටේ දියුණුවට යොදන ලද අතර යටිතල පහසුකම් අධ්‍යාපනය

4 වෙනි පිටුව බලන්න →



**ජේසු බිළිඳු සහ දේව මාතාව Madona & Child - A Painting by Pompeo Batoni (1708-1787)**

වි ඳි මි න් සුවය මව් තුරුලේ වෙළේයා
පු ත ණු න් ගෙළ එතී මුහුණට එබේයා
සෙනෙහෙන් මවුන් හද උතුරා ගලායා
ලො ව ඉ න් දහස් හිරු පායා දිලේයා

♦ *දයා ආනන්ද රණසිංහ*




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට
සාමය සතුට පිරි, අසිරිමත් නත්තලක් සහ
සුබ නව වසරක් වේවා!

MCG
FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර පිටු අංක 3